
SUPERIOR COURTS COMPLEX BOARD OF MANAGEMENT



ANNUAL REPORT -2023

CONTENT

			Page No
1.	Introduction of the Board		
2.	Board Appointed Sub Committees		01-03
3.	Our Envisioned Future		
	❖ Vision, Mission and Objective		04
4.	Changers in Human Resources for 2023		05-06
5.	Board Members Names		
	❖ Appointments, Promotions and Resignation for the SCCBM Staff 2023		07
6.	Appreciation from the Chief Executive Officer		08
7.	Financial Statements – 2023		
	❖ Overview of the year of 2023		09-10
	❖ Independent Audit Report	Sinhala	11-21
	❖ Progress of Audit Report for the year 2023		22-23
	❖ Audited Financial Statements		24-57
	-Statement of Financial Position		
	- Statement of Income & Expenditure		
	- Notes to the Financial Statements		
	- Statement of Cash Flow		
	- Statement of changes in Equity		52-53
	-SCCBM Activities for the year of 2023		54
	-Funds Availability December 2023		55
	- Graph For Expenditure of 2023		56
	-Training and Capacity Development 2023		57
7.	Financial Statements - 2023		
	Introduction of the Board		
	❖ Our Envisioned Future		
	❖ Board Appointed Sub Committees		58-59
	❖ Vision, Mission and Objectives		
	Changers in Human Resources for 2023		60
	❖ Appointments, Promotions and Resignation for the		61-62
	SCCBM Staff 2023,Board Members		63-64
	- Appreciation from the Chief Executive Officer		65-67
	-Audited Financial Statements		68-103
	-Statement of Financial Position	Tamil	
	-Statement of Income & Expenditure		
	-Notes to the Financial Statements		
	-Statement of Cash Flow		
	- Statement of changes in Equity		104-105
	-SCCBM Activities for the year of 2023		106
	-Funds Availability December 2023		107
	-Graph for Expenditure of 2023		108
	-Training and Capacity Development 2023		109
8.	Financial Statements – 2023		
	Introduction of the Board		110-111
	❖ Board Appointed Sub Committees ,Board Member		112-113
	❖ Vision, Mission and Objectives		114
	Appointments, Promotions and Resignation for the		115-116
	SCCBM Staff 2023		
	❖ Appreciation from the Chief Executive Officer–		117
	❖ Independent Audit Report		118-129
	❖ Overview of the year of 2023		130-131
	-Statement of Financial Position	English	132-158
	-Statement of Income & Expenditure		
	- Notes to the Financial Statements		
	-Statement of Cash Flow		
	-Statement of changes in Equity		159-160
	-SCCBM Activities for the year of 2023		161
	- Fund Availability Statement December 2023		162
	-Graph of distribution expenditure for 2023		163
	-Training and Capacity Development 2023		164
	-Corporate Plane Report-2023-2027		166-178
	- Graph of type of received other Income for 2023		179

උපරිමාධිකරණ සංකීර්ණ
කළමනාකරණ මණ්ඩලය

වාර්ෂික වාර්තාව - 2023

2023 වර්ෂය සඳහා උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

උපරිමාධිකරණ කළමනාකරණ මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරි විසින් 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ උපරිමාධිකරණ කළමනාකරණ මණ්ඩලයේ තිස්හය වන (36) වාර්ෂික වාර්තාව මෙසේ ඉදිරිපත් කර සිටිනු ලැබේ. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, ආදායම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශ වලට අදාළ සටහන් ඇතුළත් උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන මෙහි පිටු අංක 07 සිට 32 දක්වා පිටුවල දක්වා ඇත.

හැඳින්වීම

උපරිමාධිකරණ සංකීර්ණය හා එහි ගොඩනැගිලිවල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා එයට අලුතින් කොටස් එකතු කිරීම, වෙනස් කිරීම හා වැඩි දියුණුකිරීම් ඇතුලු ඒවා පාලනය කිරීම, පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ නඩත්තු කිරීම අරමුණු කර ගනිමින් 1987 අංක 50 දරණ පනත මගින් උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය ස්ථාපිත කර ඇත.

පනතේ 3(1) වගන්තියට අනුව කළමනාකරණ මණ්ඩලය පහත සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

(i) ගරු අග්‍ර විනිශ්චයකාර තුමා
(ii) ගරු අග්‍ර විනිශ්චයකාර තුමා විසින් පත් කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙක්
(iii) අභියාචනාධිකරණයේ සභාපති තුමා
(iv) අභියාචනාධිකරණයේ සභාපති තුමා විසින් පත් කරනු ලබන අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයෙක්
(v) අධිකරණ විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා
(vi) රාජ්‍ය නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ලේකම්වරයා
(vii) ශ්‍රී ලංකා නීතීඥ සංගමයේ සභාපතිවරයා
(viii) කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා
(ix) මුදල් විෂය භාර අමාත්‍යාංශයේ නියෝජිතයෙක්
(X) ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදීජනරජයේ ගරු ජනාධිපති තුමා විසින් පත් කරනු ලබන සාමාජිකයින් දෙදෙනෙක්

මණ්ඩලය විසින් පත් කරන ලද අනු කමිටු -2023

(1) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව

(i) ඩබ්ලිව්.ඩී.එල්.පී. වික්‍රමසිංහ මහතා - සභාපති (2023.01.01-2023.11.20)
(ii) එල්.එම්.එස්.කේ.ලීලාරත්න මහතා - සභාපති (2023.11.20- 2023.12.31)
(iii) එස්.එම්.යූ.එස්.සමරකෝන් මහතා - සාමාජික
(iv) කේ.ඒ.ඩී.යූ.පීරිස් මහත්මිය - ලේකම්
(v) එම්.සී.දිල්රුක්ෂි සිල්වා මහත්මිය - විකල්ප සාමාජික

(2) සුළු ප්‍රසම්පාදන කමිටුව

(i) ඩබ්ලිව්.ඩී.එල්.පී.වික්‍රමසිංහ මහතා - සභාපති (2023.01.01-2023.11.20)
(ii) එල්.එම්.එස්.කේ.ලීලාරත්න මහතා - සභාපති (2023.11.20- 2023.12.31)
(iii) කේ. හපුආරච්චි මහත්මිය - සාමාජික
(iv) ඊ.ඩී.එල්.ප්‍රේමජිත් මහතා - ලේකම්
(v) කේ.ඩබ්ලිව්.ටී.ආර් වේරගම මහතා - විකල්ප සාමාජික
(vi) අයි.යූ.කොඩිතුවක්කු මහත්මිය - විකල්ප සාමාජික

(3) තාක්ෂණික ඇගයීම් කමිටුව


(i) කේ.ඩබ්ලිව්.ටී.ආර්.වේරගම මහතා - සභාපති
(ii) එච්.ඩබ්ලිව්.අනුර මහතා - සාමාජික
(iii) අයි.පී.එල්.සවින්ත මහතා - සාමාජික
(iv) අයි.එම්.ඉන්ශාෆ් මහතා - සාමාජික
(v) අයි .යූ.කොඩිතුවක්කු මහත්මිය -සාමාජික

(4) ලංසු විවෘත කිරීමේ කමිටුව

(i) එස්.ඩබ්ලිව්.වී.කේ.ද සිල්වා මහත්මිය - සාමාජික
(ii) අයි .යූ.කොඩිතුවක්කු මහත්මිය -සාමාජික
(iii) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහකාර - සාමාජික
ලංසු ගොනුව අදාල අංශයේ

කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් විශ්‍රාම ගැනීම, ඉල්ලා අස්වීම සහ පත් කිරීම - 2023 වර්ෂය

2023-02-09	අභියාචනාධිකරණයේ හිටපු සභාපති ගරු ප්‍රියන්ත ප්‍රනාන්දු මහතා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයකු වශයෙන් පත්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩුවට අභියාචනාධිකරණයේ විනිසුරු ගරු. එන්. ඔන්දුල කරුණාරත්න මහතා, කළමනාකරණ මණ්ඩලයේ නිළ බලයෙන් සාමාජිකයෙකු ලෙස පත් විය.
2023-02-22	අභියාචනාධිකරණ විනිසුරු ගරු එන්. ඔන්දුල කරුණාරත්න මහතා අභියාචනාධිකරණයේ සභාපතිවරයා වශයෙන් පත්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩුව පිරවීම සඳහා අභියාචනාධිකරණ විනිසුරු ගරු ආචාර්ය රුවන් ප්‍රනාන්දු මහතා, කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.
2023-03-27	ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ හිටපු සභාපති සාලිය පීරිස් පී.සී මහතා වෙනුවට ශ්‍රී ලංකා නීතීඥ සංගමයේ නව සභාපති කෞෂල්‍ය නාවරත්න මහතා කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත්විය.
2023-06-23	අභියාචනාධිකරණ විනිසුරු ගරු ආචාර්ය රුවන් ප්‍රනාන්දු මහතා ගේ විශ්‍රාම යාමෙන් ඇති වූ පුරප්පාඩු සඳහා අභියාචනාධිකරණ විනිසුරු ගරු සෝභිත රාජකරුණා මහතා කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.



දැක්ම ප්‍රකාශය

කළමනාකරණ මණ්ඩලයේ දර්ශනය වනුයේ ශ්‍රී ලංකා උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම කළමනාකරණයකින් යුතු මණ්ඩලය බවට පත් කිරීමය.

මෙහෙවර ප්‍රකාශය

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ මෙහෙවර වනුයේ පවත්නා ගොඩනැගිලි නඩත්තු කිරීම සහ වැඩි දියුණු කිරීම මගින් ඒවා භාවිතයට ගන්නා විනිශ්චය කාරවරුන්, නීතිඥවරුන්, නඩු කියන්නන්, අධිකරණ අමාත්‍යාංශයේ සේවකයින් සහ මාර්ෂල් කාර්යාලයේ සේවකයින්, සෙසු මහජනතාව ඇතුළු සියළු දෙනාට තම කාර්ය කාර්යක්ෂමව සහ ඵලදායි අයුරින් ඉටු කිරීමට සහ ඉටු කරවා ගැනීමට අවශ්‍ය වඩාත් ජනහිතකාමී පරිසරයක් සැකසීම තුලින් දර්ශනය සාක්ෂාත් කර ගැනීම වේ.

පරමාර්ථ ප්‍රකාශය

උපරිමාධිකරණ සංකීර්ණය සහ එහි ගොඩනැගිලි පාලනය කිරීම, පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ නඩත්තු කිරීම ද සංකීර්ණයේ සහ එහි ගොඩනැගිලි වල ඇති පහසුකම් වැඩි කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි ඊට අලුතින් කොටස් එකතු කිරීම, වෙනස් කිරීම සහ ඒවා වැඩි දියුණු කිරීම ද මණ්ඩලයේ පරමාර්ථ වන්නේය.

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය
මණ්ඩල සාමාජිකයින් 2023

සාමාජික නාම ලේඛනය

01 ගරු. ජනාධිපති නීතිඥ ජයන්ත
ජයසූරිය
ප්‍රධාන විනිසුරු

02 ගරු. වී.කේ.මලල්ගොඩ,
ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරු

03 ගරු එන් බන්දුල කරුණාරත්න
ජනාධිපති අභියාචනාධිකරණය

04 ගරු සෝභිත රාජකරුණා
අභියාචනාධිකරණ විනිසුරු

05 වසන්තා පෙරේරා මහත්මිය
ලේකම්
අධිකරණ බන්ධනාගාර කටයුතු සහ
ව්‍යවස්ථා කටයුතු අමාත්‍යාංශය,
කොළඹ 12.

06 ඩබ්ලිව්.එස්.යතුන්නන්ද මහතා
ලේකම්,
නාගරික සංවර්ධන හා නිවාස
අමාත්‍යාංශය,
බත්තරමුල්ල.

07 කෞශල්‍ය නාවරත්න මහතා සභාපති
ශ්‍රී ලංකා නීතිඥ සංගමය

08 නාගරික කොමසාරිස්
කොළඹ මහ නගර සභාව

09 අරන්දර මහකා.ඒ.කේ.ඩී.ඩී.ඩී.ඩී
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (වැඩ
බලන)
මුදල් අමාත්‍යාංශයේ නීති කටයුතු
දෙපාර්තමේන්තුව
ලේකම් කාර්යාලය
කොළඹ 01.

10 රොහාන් සහබන්දු මහතා,
ජනාධිපති නීතිඥ

11 සුගත් කල්දේරා මහතා
නීතිඥ - පත්කළ සාමාජික

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ සෙවා නියුක්තීන්ගේ වෙනස් වීම - 2023

(බඳවා ගැනීම්, විශ්‍රාම ගැනීම්, ඉල්ලා අස් වීම් සහ සේවය හර යාම්)

අනු අංකය	තනතුර	බඳවා ගැනීම්	උසස් වීම්	විශ්‍රාම ගැනීම්	ඉල්ලා අස් වීම්	සේවය හර යාම්
01.	කාර්මික ශිල්පී (යාන්ත්‍රික) III ශ්‍රේණිය	01	-	-	-	01
02.	ආරක්ෂක සහකාර I ශ්‍රේණිය	-	-	05	-	-
	II ශ්‍රේණිය	-	-	04	-	-
	III ශ්‍රේණිය	-	-	-	03	01
03.	කළමනාකරණ සහකාර I ශ්‍රේණිය	-	-	01	02	-
	III ශ්‍රේණිය	-	-	-	01	-
04.	ආරක්ෂක නිලධාරී II ශ්‍රේණිය	-	-	01	-	-
05.	නඩත්තු නිලධාරී (වා/ස,ජ/සැ සහ මෙහෙයුම්) II ශ්‍රේණිය	01	-	01	-	-
06	නඩත්තු නිලධාරී (විදුලි) II ශ්‍රේණිය	01	-	-	-	-
07.	ප්‍රසම්පාදන නිලධාරී	01	-	-	01	-
08.	ගෘහ/උද්‍යාන සහායක III ශ්‍රේණිය	02	-	-	02	-
09.	කාර්යාල කාර්ය සහායක I ශ්‍රේණිය			01		
	III ශ්‍රේණිය	01				
10.	නඩත්තු සහායක I ශ්‍රේණිය			01		
	III ශ්‍රේණිය	02				
11	අභ්‍යන්තර විගණන නිලධාරී II ශ්‍රේණිය				01	
12	මාර්ෂල්	01		01		

M.C. Dilrukshi Silva
MBA (HRM), B.Sc Mgt (sp) - USJP
Manager (Administration & Human Resources)
Superior Courts Complex,
Hulftsdorp Street, Colombo- 12.

12/08/2024

උපරිමාධිකරණ සංකීර්ණ

කළමනාකරණ මණ්ඩලය

2023.12.31 දිනට අනුමත කාර්ය මණ්ඩලය

අනු අංකය	විස්තරය	වැටුප් පරිමාණය	අනුමත කාර්ය මණ්ඩලය	වර්තමාන කාර්ය මණ්ඩලය	පුරප්පාඩු
01	මාර්ෂල් (ප්‍රධාන විධායක නිලධාරී)	HM 1 - 3	1	1	-
02	කළමනාකරු (ඉංජිනේරු සේවා)	MM 1 - 1	1	1	-
03	කළමනාකරු (මූල්‍ය)	MM 1 - 1	1	1	-
04	කළමනාකරු (ආරක්ෂක)	MM 1 - 1	1	1	-
5	කළමනාකරු (පරිපාලන හා මානව සම්පත්)	MM 1 - 1	1	1	-
06	නඩත්තු නිලධාරී (විදුලි)	JM 1 - 1	1	1	-
07	නඩත්තු නිලධාරී(වායු සමීකරණ,ජල සම්පාදන හා මෙහෙයුම්)	JM 1 - 1	1	1	-
08	නඩත්තු නිලධාරී (සිවිල්)	JM 1 - 1	1	1	-
09	පරිපාලන නිලධාරී	JM 1 - 1	1	1	-
10	ගිණුම් නිලධාරී	JM 1 - 1	1	1	-
11	ගෘහ පාලන නිලධාරී	JM 1 - 1	1	1	-
12	මාර්ෂල්ගේ ලේකම්	JM 1 - 1	1	1	-
13	ආරක්ෂක නිලධාරී (පරිපාලන)	JM 1 - 1	1	-	1
14	ආරක්ෂක නිලධාරී (මෙහෙයුම්)	JM 1 - 1	1	1	-
15	ප්‍රසම්පාදන නිලධාරී	JM 1 - 1	1	1	-
16	අභ්‍යන්තර විගණක නිලධාරී	JM 1 - 1	1	-	1
17	තාක්ෂණ සහකාර (විදුලි)	MA 2 - 2	1	1	-
18	තාක්ෂණ සහකාර ((වායු සමීකරණ,ජල සම්පාදන හා මෙහෙයුම්)	MA 2 - 2	1	1	-
19	තාක්ෂණ සහකාර (සිවිල්)	MA 2 - 2	1	1	-
20	තාක්ෂණ සහකාර (දුරකථන සහ ඉලෙක්ට්‍රොනික්)	MA 2 - 2	1	1	-
21	කළමනාකරණ සහකාර	MA 1 - 2	30	20	10
22	ආරක්ෂක සහකාර	MA 1 - 2	70	40	30
23	කාර්මික ශිල්පී (යාන්ත්‍රික)	P/L 3 Skilled	4	4	-
24	කාර්මික ශිල්පී (සිවිල්)	P/L 3 Skilled	1	1	-
25	කාර්මික ශිල්පී (ඉලෙක්ට්‍රොනික් /විදුලි)	P/L3 Skilled	13	9	4
26	කාර්මික ශිල්පී (පෙදරේරු)	P/L3 Skilled	1	-	1
27	කාර්මික ශිල්පී (වඩු)	P/L3 Skilled	1	1	-
28	රියදුරු	P/L3 Skilled	4	4	-
29	කාර්යාල කාර්ය සහායක	P/L1 Unskilled	9	5	4
30	ගබඩා සහායක	P/L1 Unskilled	1	1	-
31	ගෘහ /උද්‍යාන සහායක	P/L1 Unskilled	17	12	5
32	නඩත්තු සහායක	P/L1 Unskilled	8	7	1
33	ආයුධ/උපකරණ සහායක	P/L1 Unskilled	1	1	-
			180	123	57

02/01/2024

H.G. Kithsiri Silva
MBA (HRM), B.Sc Mgt (sp) - USJP
Manager (Administration & Human Resources)
Superior Courts Complex,
Hulftsdorp Street, Colombo- 12.

ස්තුතිය ප්‍රකාශකිරීම

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකාරණ මණ්ඩලය, පහත සඳහන් පාර්ශව විසින් එම මණ්ඩලය වෙත ලබා දෙන ලද උපකාර සහ සහයෝගිතාවය පිළිබඳ කෘතඥතාවය පලකර සිටියි.

- අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් සහ කාර්ය මණ්ඩලය
- භාණ්ඩාගාර ලේකම්වරයා සහ මුදල් අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය
- ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා සහ කාර්ය මණ්ඩලය
- අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා සහ කාර්ය මණ්ඩලය
- රජයේ කර්මාන්ත දෙපාර්තමේනතුව
- සෞ. වෛ. නි. (සෞඛ්‍ය වෛද්‍ය නිලධරී) සහ ඔහුගේ කොළඹ නගර සභාව කාර්ය මණ්ඩලය
- ශ්‍රී ලංකා රතු කුරුස සමාජය
- නාගරික කොමසාරිස්, කොළඹ මහ නගර සභාව
- ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපතිවරයා සහ අනෙකුත් නිලධාරීන් සහ කාර්යාල කාර්ය මණ්ඩලය
- උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ සියලුම සාමාජිකයන්
- විනිසුරුවරුන්ගේ කුටි සඳහා බෙදුම් වායුසමීකරණ යන්ත්‍ර 11 ක් නොමිලේ (FOC) ස්ථාපනය කිරීමට උපකාරී වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාපති සහ තාක්ෂණික කණ්ඩායම

එයාර් වයිස් මාර්ෂල් ඉංජිනේරු එල්. එම්. එස්. කේ. ලීලාරත්න (විශ්‍රාමික)
මාර්ෂල්/ප්‍රධාන විධායක නිලධාරී
උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය

සමාලෝචිත කාල සීමාව තුළ ක්‍රියාකාරකම් - 2023 වර්ෂය

උපරිමාධිකරණ සංකීර්ණයේ සාමාන්‍ය පාලන කටයුතු, පරිපාලනය, කළමනාකරණය සහ නඩත්තුව කිරීම් වලට අමතරව, 2022 වර්ෂයේදී සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.

1. **ප්‍රාග්ධන වත්කම් යටතේ ගොඩනැගිලි සහ ව්‍යුහයන්**
   - නීතීඥ සංගම් ගොඩනැගිල්ලේ විශේෂ මහාධිකරණ අංක 211 සඳහා පරීක්ෂණ මට්ටමින් ජල පීඩන උපකරණයක් සවිකිරීම
   - විනිසුරු නිල නිවාසයේ වහලේ ජල කාන්දුවීම් අළුත්වැඩියා කිරීම
   - සිවිල් අභියාචනා මහාධිකරණ ගොඩනැගිල්ලේ ව්‍යුහාත්මක ගැටළු නිවැරදි කිරීම

2. **ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම**

(i) **කාර්යාල උපකරණ මිල දී ගැනීම**
   - අභයන්තර විගණන අංශය සඳහා වානේ කබඩ් එකක් මිල දී ගැනීම
   - පරිපාලන අංශය සඳහා ලේසර් මුද්‍රණ යන්ත්‍රයක් මිල දී ගැනීම
   - මාර්ෂල් නි ලේකම් කාර්යාලය සඳහා මේසය මත ලබන පරිගණකයක් මිල දී ගැනීම
   - මූල්‍ය අංශය සඳහා ඡායා පිටපත් යන්ත්‍රයක් මිල දී ගැනීම
   - මූල්‍ය අංශය සඳහා යූපීඑස් යන්ත්‍රයක් මිල දී ගැනීම
   - ශ්‍රේෂ්ඨාධිකරණයේ ලඝු ලේඛන අංශය සඳහා සිටුවන විදුලි පංකා යන්ත්‍ර 2 ක් මිලදී ගැනීම
   - අධිකරණ ආරක්ෂක අංශය සඳහා සිටුවන විදුලි පංකා යන්ත්‍රයක් මිලදී ගැනීම
   - ජල බෙදුම් යන්ත්‍ර 2 ක් මිල දී ගැනීම
   - අභියාචනාධිකරණ ලඝු ලේඛන අංශයේ පාත මාලය සඳහා සිටුවන විදුලි පංකා යන්ත්‍ර 2 ක් මිල දී ගැනීම
   - විනිසුරු නිල නිවාස අංක 86/5 සඳහා සිටුවන විදුලි පංකා යන්ත්‍රයක් මිල දී ගැනීම
   - ඉංජිනේරු අංශය සඳහා මුද්‍රණ යන්ත්‍රයක් මිල දී ගැනීම
   - ආරක්ෂක අංශය සඳහා මුද්‍රණ යන්ත්‍රයක් මිල දී ගැනීම
   - ගෘහ පාලන අංශය සඳහා මේසය මත ලබන පරිගණකයක් මිල දී ගැනීම
   - ආරක්ෂක අංශය සඳහා මේසය මත ලබන පරිගණකයක් මිල දී ගැනීම

(ii) **මෙවලම් සහ උපකරණ මිල දී ගැනීම**
   - ගිල්විය හැකි පොම්පයක් මිලදී ගැනීම

(iii) **යන්ත්‍ර සහ පිරියත සවිකිරීම් මිල දී ගැනීම**
   - වායු සමීකරණ ස්ථාපිත කිරීමේ උපාංග 11 ක් මිල දී ගැනීම

2023 වසර සඳහා රජයේ ප්‍රදානයන්

*මහ භාණ්ඩාගාරය විසින් 2023 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් වෙනුවෙන් (228-01-01-01-1503) රුපියල් **110,630,000.00** ක අග්‍රිමයක් ලබා දී ඇත.

*මහ භාණ්ඩාගාරය විසින් 2023 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් වෙනුවෙන් (228-01-01-01-1509) රුපියල් **95,010,000.00** ක අග්‍රිමයක් ලබා දී ඇත.

*මහ භාණ්ඩාගාරය විසින් 2023 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් (228-01-01-01-2201) වෙනුවෙන් රුපියල් **12,750,000.00** ක අග්‍රිමයක් ලබා දී ඇත.

විස්තරය	**2023** වර්ෂය සඳහා අරමුදල් වෙන්කිරීම රු.	**2023.12.31** දිනට භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලැබීම රු.
පුනරාවර්තන වියදම් -1503	120,000,000.00	110,630,000.00
පුනරාවර්තන වියදම් - 1509	102,376,000.00	95,010,000.00
ප්‍රාග්ධන වියදම් -2201	13,000,000.00	12,750,000.00

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. JLO/B/SCCBM/FA/2023/06 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2024 මැයි 31 දින

SUPERINTENDENT BOAK
07 JUN 2024
උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය

මාර්ෂල්

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයඉසඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත්: 01. ලේකම්, මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

02. ලේකම්, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

Myr Finance / Myr Justice
Pl return accordingly
7/6/24

See mail
Pl inform finance BM
10/6

අංක 306/72, පොළොන්නරුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்நறுவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. JLO/B/SCCBM/FA/2023/06 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2024 මැයි 31 දින

මාර්ෂල්,

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 කත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 55 වන ඡේදය ප්‍රකාරව අස්ථිත්වයන් විසින් මූල්‍ය ප්‍රකාශනවල අයිතමයන්ගේ ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණයන් සංශෝධනය කළ විට ප්‍රායෝගික නොවන්නේ නම් හැර සංසන්දනාත්මක අගයයන් යළි වර්ගීකරණය කර වර්ගීකරණයේ ස්වභාවය, වර්ගීකරණය කළ එක් එක් අයිතමයන් හෝ අයිතම පංතියේ අගය සහ යළි වර්ගීකරණය කිරීමට හේතු යන කරුණු මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කළ යුතු නමුත්, මණ්ඩලය විසින් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ 2022 වර්ෂයට අදාළව අගයයන් යළි වර්ගීකරණය කිරීම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 79 වන ඡේදය ප්‍රකාරව ජංගම වත්කම්වලට ඒවා වාර්තා කරන දිනයෙන් මාස දොළහක් තුළ උපලබ්ධි වෙතැයි අපේක්ෂා නොකළත් සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ උපලබ්ධි කිරීම සඳහා තබා ඇති වත්කම් අයත්වන නමුත්, රු.1,350,000 ක් වූ අයකර ගැනීමට නොහැකි වූ කුලී තැන්පතු ජංගම නොවන වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 80 (ඇ) වන ඡේදය ප්‍රකාරව වාර්තාකරණ දිනෙන් මාස 12 ක් තුළ නිරවුල් කිරීමට නියමිත වගකීම් ජංගම වගකීම් ලෙස හඳුනා ගනු ලැබිය යුතු වුවද, පාරිතෝෂික වෙන්කිරීම්වලට අදාළව ජංගම වගකීම් ප්‍රමාණය සහ ජංගම නොවන වගකීම් ප්‍රමාණය මණ්ඩලය ගණනය කිරීම් අනුව පිළිවෙලින් රු.3,158,020 ක් සහ රු.28,958,085 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය පිළිවෙලින් රු.1,421,150 ක් සහ රු.30,694,957 ක් දක්වා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 හි 47 වන ඡේදයට පටහැනි ලෙස, 2022 වර්ෂයේ අධිකරණ අමාත්‍යාංශය විසින් මණ්ඩලය වෙත පවරා දුන් රු.මිලියන 9 ක් වටිනා මෝටර් රථයක්, මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනා ගැනීමේදී වූ වරද නිවැරදි කිරීමේදී අතීතානුයෝගීව නිවැරදි කිරීමට කටයුතු සිදු කර නොතිබුණු අතර තවත් වාහනයකට අදාල ප්‍රත්‍යාගණන අතිරික්තය වූ රු.3,500,000ක් සමාලෝචිත වර්ෂයේදී සාවද්‍ය ලෙස ප්‍රාත්‍යාගණන සංචිතය ගිණුම හර කර සමුච්චිත ආදායම් හා වියදම් ගිණුම බැර කර තිබුණි.

තවද මෙම ප්‍රමිතියට පටහැනි ලෙස, 2010 වර්ෂයේ ප්‍රත්‍යාගණනය කරන ලද ගොඩනැගිලි සහ 2022 වර්ෂයේ ප්‍රත්‍යාගණනය කරන ලද මෝටර්රථවලට අදාළ වාර්ෂික ක්ෂය වටිනාකම් වූ රු.119,200,000 ක ගිණුම්ගත කිරීමේ පෙර වර්ෂයේ වරද නිවැරදි කිරීමේදී රු.3,125,000 ක් පමණක් සමාලෝචිත වර්ෂයේ ප්‍රත්‍යාගණන සංචිත ගිණුම බැර කර, සමුච්චිත ආදායම් හා වියදම් ගිණුම හරකර තිබුණි. මෙම ප්‍රමිතියට අනුව එම වරද නිවැරදි කිරීමේදී අතීතානුයෝගීව සිදුකල යුතු වුවක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල එම නිවැරදි කිරීම් කර තිබුණි.

මීට අමතරව ඉහත ගොඩනැගිලි වටිනාකමට අදාල ප්‍රවර්ථන වර්ෂයේ ක්ෂය රු.116,075,000 ක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය තුල හඳුනාගෙන තිබුණද සාවද්‍ය ලෙස සමාලෝචිත වර්ෂයේ ප්‍රත්‍යාගණන සංචිත ගිණුම හර කර සමුච්චිත ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම බැර කර තිබුණි

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 හි 54 වන ඡේදයට පටහැනි ලෙස, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සමාලෝචිත වර්ෂයේ සංසන්දනාත්මක වර්ෂය ලෙස ඉදිරිපත් කර ඇති 2022 වර්ෂයේ අයිතම 07 කට අදාළ නිවැරදි කිරීම් වටිනාකම් නැවත ප්‍රකාශ කිරීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 50 වන ඡේදය ප්‍රකාරව එකම ස්වභාවයේ සහ එකම භාවිතයෙන් යුත් දේපළ පිරියත හා උපකරණ එකිනෙකට වෙනස් වූ පන්තීන් යටතේ වර්ගීකරණය කර දැක්විය යුතු වුවද, රු.10,465,399 ක කාර්යාල උපකරණවල ආරම්භක ශේෂයේ ඇතුළත් පරිගණක උපාංගවල වටිනාකම් හඳුනාගත නොහැකි වූ අතර, සමාලෝචිත වර්ෂයේදී ද පරිගණක උපාංග එකතු කිරීම් ලෙස රු.446,000 ක් කාර්යාල උපකරණ යටතේ දක්වා තිබුණි.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 65 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු කරමින් සෑම වාර්ෂික වාර්තාකරන කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේදී සමාලෝචනය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ක්ෂය වී අවසන් නමුත්, තවදුරටත් භාවිතයට ගනු ලබන රු.6,603,245 ක් වටිනා විදුලි සෝපානය සහ රු.851,711 ක් වටිනා ගිලන්රථය සමාලෝචනය කර නොතිබුණි. ඒ අනුව මෙම ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 අනුව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 11 හි 44 වන ඡේදය ප්‍රකාරව ලබා දී තිබූ රු.12,750,000 ක ප්‍රාග්ධන ප්‍රදානයන් නිවැරදිව වත්කම් ලෙස හඳුනාගෙන තිබූ නමුත්, අයභාර ලෙස හඳුනා ගැනීම වෙනුවට සමුච්චිත ප්‍රාග්ධන ප්‍රදාන ලෙස හඳුනාගෙන තිබුණි.

(එ) 2022 වර්ෂයේ ආදායම් වියදම් ප්‍රකාශනය තුළ විලම්බිත අයභාරය සහ වර්ෂයේ ක්ෂය වීම් ලෙස හඳුනාගත් රු.132,560,770 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ 2022 වර්ෂයේ සංසන්දනාත්මක තොරතුරුවලින් ඉවත් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් ජ'නල් සටහන් විගණනය වෙත ඉදිරිපත් නොවූ අතර ඊට අදාළ හෙළිදරව් කිරීම්ද මූල්‍ය ප්‍රකාශන තුළ සිදු කර නොතිබුණි.

(ඒ) 2004, 2006, 2008 සහ 2010 යන වර්ෂවල ආරම්භය දක්වා මිලදී ගෙන තිබූ එකතුව රු.58,833,546 ක ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ඒවායේ පැවැත්ම තහවුරු කිරීමට අවශ්‍ය උපලේඛන හෝ ලේඛණගත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය සමඟ ඉදිරිපත් කරනු ලබන හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනයේ සංසන්දනාත්මක වර්ෂය වන 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණන සංචිතයේ සහ සමුච්චිත ආදායම් හා වියදම් ගිණුමේ අවසාන ශේෂ පිළිවෙලින් රු.5,728,922,708 ක් සහ රු.(8,139,958) ක් වුව ද, එයට අනුරූපව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සමඟ ඉදිරිපත් කරනු ලබන 2022 වර්ෂයේ එම ගිණුම් ශේෂ දෙක පිළිවෙලින් රු. 5,716,422,708 ක් සහ රු.4,360,042 ක් වූයෙන් රු.12,500,000 ක වෙනසක් පැවතුණි.

(ඕ) සිවිල් අභියාචනා අධිකරණ ගොඩනැගිල්ලේ ව්‍යුහාත්මක ගැටලු අලුත්වැඩියා කිරීම සහ විනිසුරු නිල නිවාස ගොඩනැගිල්ලේ බිම් මහලේ පිහිටි ගරාජයේ කොන්ක්‍රීට් ස්ලැබ් එක අලුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේ සෘජුව ගෙවා ඇති මුදල පිළිවෙලින් රු.1,492,884 ක් සහ රු.3,431,070 ක් වූ අතර එය ගිණුම්ගත කිරීමට සහ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මනය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතු ය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර, මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවා ද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතු ය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැතිවිටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සැපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය වීකරණය කළ යුතු ය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකි ය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2 (ඇ), (ඊ), (උ), (ඌ) දක්වා ඇති නිරීක්ෂණ හැර, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණු වලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවී ය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාහකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද චෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති, රීති/ විධානයට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
i. මුදල් රෙගුලාසි 137	රු.160,764 ක් වටිනා වවුචර්පතක් සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව අනුමත කිරීම් සිදු කර නොතිබුණි.
ii. මුදල් රෙගුලාසි 262 (2)	ගෙවන ලද සියලුම වවුචර්පත්වලත් ඒවා තහවුරු කරන ලියවිලිවලත් "ගෙවන ලදී" යන මුද්‍රාව යෙදිය යුතු නමුත්, එකතුව රු.727,917 ක ගෙවීම් වවුචර් 08 ක් පිළියෙල කිරීමේදී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

iii. මුදල් රෙගුලාසි 1645 (අ)	වාහන තුනකට අදාළව පවත්වාගෙන යනු ලබන ලොග් සටහන් පොත්වල, මිලදී ගත් මුදල හා මිලදී ගත් දිනය ඇතුළත් කර නොතිබුණි.
(ආ) 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයෙහි 2 (i) ඡේදය	අධිකරණ අමාත්‍යාංශය විසින් ලබාදී තිබූ වාහනයක් වාර්තාවේ දින වන විටත්, චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඇ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ (පොදු ව්‍යාපාර පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය) ඡේද අංක 2.3 හි උපලේඛන I	චක්‍රලේඛ ප්‍රකාරව උපායමාර්ගික සැලැස්මක් මණ්ඩලය විසින් පිළියෙල කර නොතිබුණි.
(ඈ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය	
i. මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.3.1 (ඈ), ප්‍රසම්පාදන අත්පොතේ 2.8.4 සහ 7.11.1 ඡේද	ලංසු ඇගයීම සඳහා උපදේශකයන්ගේ සේවය ලබාගැනීමේදී තාක්ෂණික ඇගැයීම් කමිටුව විසින් තම කමිටුවේ විධිමත් වාර්තාවක් සමඟ උපදේශකයන්ගේ වාර්තාව ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු නමුත්, නිලධාරීන් සඳහා නිල ඇඳුම් මිලදී ගැනීම සඳහා රු.955,900 ක් වටිනාකමක් වූ ප්‍රසම්පාදනයේදී, පත් කරනු ලැබූ තේරීම් කමිටු වාර්තාවක් පදනම්ව ප්‍රසම්පාදන අත්පොතෙහි 2.8.4 පටහැනිව විෂය පිළිබඳ දැනුම ඇති අයෙකු නොමැති වූ තාක්ෂණික ඇගයීම් කමිටුවක නිර්දේශයක් ලබාදී තිබුණි. තවද, ප්‍රසම්පාදන අත්පොතේ 7.11.1 ප්‍රකාරව ලංසු ඇගයීම් වාර්තාවක් තාක්ෂණික ඇගැයීම් කමිටුව විසින් පිළියෙල කළ යුතු අතර, එහිදී ප්‍රතික්ෂේප කරන ලද ලංසු සහ ඊට හේතූන් ඉදිරිපත් කළ යුතු නමුත්, තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවේ මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කර නොතිබුණි.
ii. මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදය	අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු නමුත්, මණ්ඩලය විසින් එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඉ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) ඡේදය	මණ්ඩලයේ අභ්‍යන්තර විගණන කටයුතු කිරීම සඳහා එම මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් පත්කරනු ලබන තමාගේම අභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතු නමුත්, 2023 ජූනි 01 සිට මණ්ඩලයේ කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණකවරයෙකු ඇතුළත්ව නොතිබුණි. තව ද මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව මණ්ඩලයේ මුදල් කටයුතුවලට අදාළ අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත යොමුකළ යුතු නමුත්, සමාලෝචිත වර්ෂයට අදාළ අභ්‍යන්තර විගණන වාර්තා, වාර්තාවේ දිනය වන විටත් ඉදිරිපත් කර නොකිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැරවීම

i. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ප්‍රකාරව ජාතික තරඟකාරී ලංසු කැඳවීමේදී අවම දින 21 ක් ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලබාදිය යුතු නමුත්, මණ්ඩලය පවිත්‍රතා සේවා සැපයීම සඳහා වූ ප්‍රසම්පාදනය සඳහා දින 18 ක් පමණක් ලබාදී තිබූ අතර ලංසු ඉදිරිපත් කර තිබුණේද එක් අයෙකු පමණක් විය.

ii. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.12.2 (අ) ප්‍රකාරව එක් ලංසුවක් පමණක් ලැබුණ ද, වෙළඳපොළ වටිනාකම් අනුව සැසඳීමක් සිදු කර මිල ගණන් සාධාරණ බව තීරණය කළ හැකි නමුත්, විනිසුරුවරුන්ගේ භෝජනාගාරය සඳහා මිල ගණන් කැඳවීමට අදාළව 2023 අප්‍රේල් 17 දින සැපයුම්කරුවන් 08 ක් වෙත මිල ගණන් කැඳවීමට ආරාධනා කර ඇති අතර, එක් සැපයුම්කරුවෙකු පමණක් ඊට ප්‍රතිචාර දක්වා තිබුණු බැවින්, මෙම ප්‍රසම්පාදනයට අදාළව වෙළඳපල මිල ගණන් සැසඳීමක් සිදුකර නොතිබුණි.

iii. කොන්ත්‍රාත් වටිනාකම රු.444,000 ක් වූ විනිසුරුවරුන්ගේ නිල නිවාස අලුත්වැඩියා කිරීමේදී 2023 මාර්තු 14 සහ 2023 ජුනි 20 දින තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතීන් ලබාදී තිබියදී අදාළ කාර්යයන් ආරම්භ කිරීමකින් තොරව, 2023 ඔක්තෝබර් 03 දින පැවති කළමනාකරණ මණ්ඩල රැස්වීම් තීරණය මත අදාළ මිල ගණන් පත්‍ර හා වලංගු කාලය සහ ලංසු සුරක්ෂණයේ වලංගු කාලය අවසන්වීම යන සාධක මත මෙම කොන්ත්‍රාත්තුව අවලංගු වී තිබුණි.

2.3 වෙනත් කරුණු

මණ්ඩලයේ ආරක්ෂක හා ඉංජිනේරු අංශ සේවකයින් සඳහා බාහිර පාර්ශවයකින් කුලී පදනම මත ලබාගත් ගොඩනැගිල්ලක් සඳහා අදාළ කුලී ගිවිසුම 2022 අගෝස්තු 04 දින අවලංගු කර තිබුණු අතර, ගිවිසුම්ගත වීමේදී ගොඩනැගිලි හිමිකරු වෙත තැන්පත් කරන ලද මාස 03 ක කුලී තැන්පත් මුදල වන රු. 1,350,000 ක මුදල වාර්තාවේ දිනය වන විටත් අයකරගෙන නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය
மீயுயர் நீதிமன்றக் கட்டிடத் தொகுதியின் முகாமைச் சபை
SUPERIOR COURTS COMPLEX BOARD OF MANAGEMENT

මාර්ෂල් කාර්යාලය,
උපරිමාධිකරණ සංකීර්ණය,
තැ.පෙ. 223, අල්ෆ්ස්ඩෝ,
කොළඹ 12.

மார்ஷல் அலுவலகம்,
மீயுயர் நீதிமன்றக் கட்டிடத் தொகுதி,
அ.பெ. 223, புஞுக்கடை,
கொழும்பு 12.

OFFICE OF THE MARSHAL,
SUPERIOR COURTS COMPLEX,
P. O. BOX 223, HULFTSDORP STREET,
COLOMBO 12.

SCC/FIN/AUDIT/2023/12

2024.06.26

විගණන අධිකාරී තුමිය,
රජයේ විගණන අංශය,
අධිකරණ අමාත්‍යාංශය,
අංක 19,
සංඝරාජ මාවත,
කොළඹ - 10.

<u>උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් තොරතුරු හා නියාමන අවශ්‍යතා පිලිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව</u>

යොමුව :- ඔබේ අංක JLO/B/SCCBM/FA/2023/06 දරණ 2024.05.31 දිනැති විගණකාධිපතිගේ වාර්තාව.

යොමුගත ලිපිය මඟින් ඉල්ලා ඇති කරුණු සම්බන්ධ ප්‍රගතිය පහත සඳහන් පරිදි ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වා සිටිමි.

1.<u>මූල්‍ය ප්‍රකාශන</u>

<u>1.2. තත්ත්වාගණය කළ මතය සඳහා පදනම</u>

අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 1 හි 55 වන ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන වල අයිතමයන්ගේ ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණයන් සංශෝධනය පිළිබඳව හෙලිදරව් කිරීම් 2024 වර්ෂයේ සිදු කරන බව දන්වමි.

ආ) රු 1,350,000 ක කුලී තැන්පතු අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බැවින් හා වසරක කාලයක් තුල ලැබීම් අවිනිශ්චිත බැවින් ඡංගම නොවන වත්කම් ලෙස දක්වා ඇති බව දන්වමි.

ඇ)) 2024 වර්ෂයේ දී පාරිතෝෂිකය නිවැරදි අගය ඡංගම වගකීම් හා දිගුකාලීන වගකීම් ලෙස ගණනය කරන බව දන්වා සිටිමි.

ඈ) ගිණුම්කරණ නිවැරදි කිරීම් 2024 වර්ෂයේ සිදු කරන බව දන්වමි.

ඉ) මුදල් ප්‍රවාහයේ නිවැරදි කිරීම් නැවත ප්‍රකාශ කිරීම 2024 වර්ෂයේ දී හෙලිදරව් කිරීම් සිදු කරන බව දන්වා සිටිමි.

ඊ) 2024 වර්ෂයේ සිට පරිභෝජක උපාංගවල වට්නාකම කාර්යාල උපකරණ තුලින් ඉවත් කර වෙන්කර ඉදිරිපත් කරන බව දන්වා සිටිමි .

උ) 2024.05.27 දින විදුලි සෝපාන නැක්සේරු කිරීම සිදු කර ඇති අතර ගිලන් රථය මේවන විට අළුත්වැඩියාව සිදු කර ආයතන පරිශ්‍රයට රැගෙන විත් නිබෙන අතර අපහරණ කිරීම් ඉදිරියේදී සිදු කරන බව දන්වමි.

ඌ) 2024 වර්ෂයේ සිට ප්‍රාග්ධන ප්‍රදානයන් අයභාර ලෙසද හඳුනා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වමි.

එ) 2024 වර්ෂයේ විලම්බිත අයභාරය හා ඊට අදාළ හෙලිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන තුල සිදු කරන බව දන්වා සිටිමි.

ඒ) ස්ථාවර වත්කම් ලේඛණයෙහි විගණන විමසුමේ දක්වා ඇති වත්කම් 08 හි ආරම්භක ශේෂයන් පවතින නමුත් එම ශේෂ තහවුරු කර ගැනීමට අප සතුව 2010 පෙර වත්කම් වල උපලේඛන හා ඉන්වොයිස් පත්

